# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 4 දරන පළාත් පාලන ආයතන (තාවකාලික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1972 සැප්තැම්බර් මස 28 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1972 ඔක්තෝබර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.)

ශ්‍රී ලංකාවේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 4 දරන පළාත් පාලන ආයතන (තාවකාලික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1972 සැප්තැම්බර් මස 28 වන දින.]

ඇල්. ඩී.—ඕ. 60/71.

**ඇතැම් පළාත් පාලන ආයතනවල සාමාජිකයන්ගේ ධුර කාලය දීර්ඝ කිරීමට හා ඇතැම් පළාත් පාලන ආයතනවල කටයුතු පරිපාලනය ඇතැම් සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත පැවරීමට විධිවිධාන සැලැස්වීම පිණිස හා ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. (1) මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 4 දරන පළාත් පාලන ආයතන (තාවකාලික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයෙහි ඒ දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් එම ආඥාවෙහි නියම කරනු ලැබිය හැකි දිනයක මේ පනත ක්‍රියාත්මක විය යුතු ය. විවිධ පරිපාලන දිස්ත්‍රික්ක සඳහා විවිධ දිනයන් නියම කරනු ලැබිය හැකි ය.

**ඇතැම් පළාත් පාලන ආයතනවල සභිකයන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම.**

2. (1) සිය ධුර කාලය දීර්ඝ කරමින් මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් ප්‍රකාර නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ධුර දරන සෑම පළාත් පාලන ආයතනයක ම සභිකයන්ගේ ධුර කාලය නියමිත දිනයෙහි සිට ගණන් ගනු ලබන මාස පහක කාලයක් ඉකුත් වන තෙක් මෙයින් තව දුරටත් දීර්ඝ කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් පළාත් පාලන ආයතනවලට අලුත් සභිකයන් තෝරා ගැනීමේ කාර්යය සඳහා වූ මහා ඡන්ද විමසීමක්, තත් කාලයෙහි එයට අදාළ ව පවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූල ව පැවැත්විය යුතු අතර, එසේ තෝරා ගනු ලබන අලුත් සභිකයන්ගේ ධුර කාලය නියමිත දින සිට ගණන් ගනු ලබන මාස පහක කාලයක් ඉකුත් වූ පසු එළඹෙන ප්‍රථම දින ආරම්භ විය යුතු ය.

**ඇතැම් පළාත් පාලන ආයතනවල කටයුතු සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් පරිපාලනය කිරීම.**

3. (1) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන ප්‍රකාර, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සහකාර පළාත් පාලන කොමසාරිස්වරයකු විසින් පරිපාලනය කරනු ලබන සෑම පළාත් පාලන ආයතනයක ම කටයුතු නියමිත දින සිට ගණන් ගනු ලබන මාස පහක කාලයක් ඉකුත් වන තෙක් ඒ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් තවදුරටත් පරිපාලනය කරනු ලැබිය යුතු අතර, ඒ අනුව යම් ලිඛිත නීතියක් යටතේ ඒ පළාත් පාලන ආයතනය හා එහි සභාපති

1—ජෙ 15470—9,243 (72/10)

සතු බලතල ක්‍රියාත්මක කිරීම හා යුතුකම් ඉටු කිරීම ඉහත කී මාස පහක කාලය තුළ ඒ සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා විසින් තවදුරටත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් පළාත් පාලන ආයතනයට සභිකයන් තෝරා ගැනීමේ කාර්යය සඳහා වූ මහා ඡන්ද විමසීමක්, තත් කාලයෙහි එයට අදාළ ව පවත්නා ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූල ව පැවැත්විය යුතු අතර, ඒ සභිකයන්ගේ ධුර කාලය නියමිත දින සිට ගණන් ගනු ලබන මාස පහක කාලයක් ඉකුත් වූ පසු එළඹෙන ප්‍රථම දින ආරම්භ විය යුතු ය.

සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් කරනු ලබන ක්‍රියා එවා අදාළ පළාත් පාලන ආයතනය හෝ එහි සභාපති විසින් කරන ලද සේ වලංගු හා බල සහිත බව.

4. 3 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ මහාජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් සහකාර පළාත් පාලන කොමසාරිස්වරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබූ හෝ ඉටු කරනු ලැබූ ඉහත කී (1) වන උපවගන්තියේ සඳහන් යම් පළාත් පාලන ආයතනයක හෝ එවැනි පළාත් පාලන ආයතනයක සභාපතිගේ යම් බලයක් හෝ යුතුකමක් අවස්ථාවෝචිත පරිදි, ඒ පළාත් පාලන ආයතනය විසින් හෝ එහි සභාපති විසින් ඒ බලය ක්‍රියාත්මක කරන ලද්දාක් මෙන් නොහොත් ඒ යුතුකම ඉටු කරන ලද්දක් මෙන් වලංගු හා බලසහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත අන් ලිඛිත නීති අභිබවා බලපැවැත් විය යුතු බව.

5. අන් කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ අන් නීතිය හා අතර යම් ගැටුමක් හෝ නො ගැලපීමක් ඇති වූ අවස්ථාවක මේ පනතේ විධිවිධාන ඒ අන් නීතිය අභිබවා බල පැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

6. මේ පනතෙහි —

"නියමිත දිනය" යන්න යම් පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් යෙදෙන විට ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන සීමා පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයෙහි මේ පනත ක්‍රියාත්මක වන දිනය ඉන් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ.